සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

තෙවන වාර පරීක්ෂණය 2020	11 ශ්‍රේණිය
மூன்றாம் தவணைப் பரீட்சை 2020	தரம் 11
Third Term Test 2020	**Grade 11**

කෘෂි හා ආහාර තාක්ෂණය	I	පැය එකයි
விவசாய மற்றும் உணவுத்தொழினுட்பவியல்	I	ஒரு மணித்தியாலம்
Agri & Food Technology	**I**	***One hour***

(01) පුරාණ වැව් පද්ධතියේ ස්වාභාවික ප්‍රදේශ එකිනෙකට විද්‍යාත්මකව සම්බන්ධව පවතී. මෙය හඳුන්වනු ලබන්නේ,

i) එල්ලංගා පද්ධතිය ලෙසය ii) වැව් ඉස්මත්ත ලෙසය
iii) පෝෂක ප්‍රදේශය ලෙසය iv) පෝෂිත ප්‍රදේශය ලෙසය

(02) බෝග වගාව කෙරෙහි දේශගුණික සාධකවල බලපෑම පිළිබඳ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ.

A - අලබෝග වල අඛණ්ඩ වර්ධනය හා දිවා කාලයේ වැඩි උෂ්ණත්වයක් හා රාත්‍රී කාලයේ අඩු උෂ්ණත්වයක් තිබීම හිතකරය.

B - කැරට් හා බීට් වල පුෂ්ප පිපීම සිදුවන්නේ එම ශාක අඩු උෂ්ණත්වයක පැළ වූ විටය.

C - දඬු කැබලි මුල් ඇද්ද වීමට සාපේක්ෂ ආර්ද්‍රතාවය වැඩිවීම හිතකරය.

මෙම ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

i) A පමණි ii) A හා B පමණි iii) A හා C පමණි iv) A, B,හා C සියල්ලම

(03) පසක් ජලයෙන් සංතෘප්ත අවස්ථාවේ සිට ක්ෂේත්‍ර ධාරිතාවට පත් වීමේදී පසෙන් ඉවත් වන ජල ආකාරය වන්නේ,

i) ජලාකර්ශණ ජලය ii) කේශාකර්ශණ ජලය
iii) නිදහස් ජලය iv) ගුරුත්වාකර්ශණ ජලය

(04) වැවක සොරොව්වෙන් පිටවන ජලයේ පීඩනය අඩු කිරීම සඳහා සකස් කර ඇති ව්‍යුහය,

i) සලපනාව ii) බිසෝකොටුව
iii) වාන් දොරටුව iv) වැව් බැම්ම

(05) සිසුන් පිරිසක් විසින් පාසල් වත්තේ වර්ෂාපතනයක් ස්ථාපිත කරන ලද අතර ගුරුතුමා විසින් එහි දෝෂයක් පෙන්වා දෙන ලදී. එම දෝෂය විය හැක්කේ එම වර්ෂාපතනය,

i) එළිමහන් ස්ථානයක පිහිටුවීමය
ii) ආසන්නව ගොඩනැගිල්ලේ උසට සමාන දුරකින් පිහිටුවා තිබීමය
iii) බිම සිට සෙන්ටිමීටර 30 ක් උසින් පුනීලකට සිටින සේ පිහිටුවා තිබීමය
iv) තෘණ කපන ලද සමතලා බිමක පිහිටුවා තිබීමය

(06) නිර්මාංශ ආහාර අනුභව කරන්නෙකුට ප්‍රෝටීන් අවශ්‍යතාවය සපුරා ලීම සඳහා ගතහැකි ආහාර කාණ්ඩයකි,

i) කැරට්, බෝංචි, බතල
ii) වට්ටක්කා, අර්තාපල්, බඩඉරිඟු
iii) පරිප්පු, මුංඇට, සෝයා
iv) තල, පරිප්පු, බඩඉරිඟු

(07) වර්ධනය බාල වී පත්‍ර කහ පැහැවී තිබුණු නිවිති ශාකයක් ගලවා බැලූ විට එහි මූල පද්ධතියේ ගැටිති රාශියක් ඇති බව දක්නට ලැබුනි. මෙම තත්වයට හේතුව විය හැක්කේ,

i) ශාකය වටපණු ආසාදනයට ලක් වී ඇති බවය
ii) මුල් වලට නයිට්‍රජන් තිරකරන බැක්ටීරියා ඇතුළු වීමය
iii) ශාකය පොස්පරස් ඌනතාවයකට ලක් වී තිබීමය
iv) ශාකයට දිලීර ආසාදනයක් වී තිබීමය

(08) පැපොල් අස්වැන්න නෙලීමට වඩාත් සුදුසු අවස්ථාව වන්නේ,

i) ඵලය සම්පූර්ණයෙන්ම කොළපාට අවස්ථාවේදීය
ii) ඵලය 80% පමණ කහපාට වූ අවස්ථාවේදීය
iii) ඵලය කොල පැහැය සිට කහ පැහැයට හැරෙන අවස්ථාවේදීය
iv) ඵලය සම්පූර්ණයෙන්ම කහ පැහැයට හැරුණු අවස්ථාවේදීය

(09) ගෙවත්තේ සිටුවනු ලැබූ කරවිල ශාකයක පත්‍ර වල තැනින් තැන සිදුරු වන සේ හානි කර තිබූ අතර කුඩා කෘමි විශේෂයක් පත්‍ර මත වසා සිටිනු දක්නට ලැබුනි. මෙසේ ශාකය මත වසා සිටි කෘමි පළිබෝධකයා විය හැක්කේ,

i) ඉල්මැස්සාය
ii) එපිලැක්නා ය
iii) ගොයම් මැස්සාය
iv) අවුලකපෝරාය

(10) ඒකීය සූර්ය ප්‍රචාරකයක් මගින් දඬු කැබලි මුල් අද්දවා ගැනීම පිළිබඳව ප්‍රකාශ කීපයක් පහත දැක්වේ.

A රෝපණ මාධ්‍ය ලෙස වැලි : කොම්පෝස්ට් : මතුපිට පස් 1:1:1 අනුපාතයට යොදා ගැනීම සුදුසුය.

B දඬු කැබැල්ල සිටුවීමට ගන්නා බඳුනේ පතුල ජලවහන සිදුරු සෑදිය යුතුය.

C ඒකීය සූරය ප්‍රචාරක සඳහා පොලිතින් බඳුනේ උසින් 3/4 පමණ රෝපණ මාධ්‍ය පිරවිය යුතුය.

ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශ වන්නේ

i) A හා C පමණි
ii) A පමණි
iii) B පමණි
iv) A,B,C සියල්ලම

(11) ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය තුලදී මුළුමනින්ම ඉවත් වන ක්ෂුද්‍ර පෝෂක වෙනුවට අලුතින් එම පෝෂක එක් කර නැවත පෙර තිබූ තත්වයට පත් කිරීම හඳුන්වන්නේ,

i) සරු කිරීම ලෙසය
ii) ප්‍රබල කිරීම ලෙසය
iii) අවම කිරීම ලෙසය
iv) පැසවීම

(12) අතුරු බෝග වගාව ලෙස හැඳින්වෙන බෝග රටාවේදී,

i) ක්ෂේත්‍රයක බෝග වර්ග 2 ක් මාරුවෙන් මාරුවට වගා කරයි

ii) ක්ෂේත්‍රයක එක් බෝගයක් දීර්ඝ කාලීනව වගා කරයි

iii) ප්‍රධාන බෝගයක් වගා කර එම බෝගයට අතරින් වෙනත් බෝගයක් හෝ බෝග වර්ග කීපයක් වගා කරයි

iv) එක් බෝගයක් වගා කර එහි අස්වැන්න නෙලීමට ආසන්න වන විට තවත් බෝගයක් ස්ථාපනය කරයි

(13) පරිණත අවධියට පසුව අස්වැන්න නෙලීම නිසා අස්වැන්නේ තන්තුමය ස්වභාවය අඩු වීම සහ වැඩි වීම පෙන්නුම් කරන බෝග වර්ග පිළිවෙලින්,

i) ලීක්ස්, මුරුංගා

ii) කැරට්, වැටකොළු

iii) බණ්ඩක්කා, මෑ

iv) තක්කාලි, බෝංචි

(14) ප්‍රෝටීන් යනු මානව පෝෂණයේදී වැදගත් වන පෝෂණ සංඝටකයකි. විටමින් පිළිබඳව වඩාක් නිවැරදි පිළිතුර වන්නේ,

A – විටමින් යනු අකාබනික සංයෝගයකි.

B - විටමින් B හා C ජලයේ අද්‍රාව්‍ය විටමින් වර්ග වේ.

C - විටමින් K රුධිරය කැටි ගැසීමට වැදගත් වේ.

i) A හා B

ii) A හා C

iii) B හා C

iv) A,B හා C යන සියල්ලම

(15)

A	B	C
සුදු පැහැතිය. ගෝලාකාර කැට වේ. ජලයේ හොඳින් දිය වේ.	ලා අළු පැහැතිය. ගෝලාකාර කැට වේ. ජලයේ මදක් දිය වේ.	රතු දුඹුරු පැහැතිය. කුඩා ස්ඵටික වේ. ජලයේ හොඳින් දිය වේ.

A,B,C යනු ඍජු පොහොර වර්ග තුනක භෞතික ලක්ෂණ කීපයකි. මෙම ලක්ෂණ අනුව A,B,C පොහොර වර්ග තුන පිළිවෙලින් ඇතුළත් පිළිතුර වන්නේ,

i) යූරියා, ත්‍රිත්ව සුපර් පොස්පෙට්, මියුරේට් ඔෆ් පොටෑෂ්

ii) යූරියා, මියුරේට් ඔෆ් පොටෑෂ් , ත්‍රිත්ව සුපර් පොස්පේට්

iii) මියුරේට් ඔෆ් පොටෑෂ් , යූරියා, ත්‍රිත්ව සුපර් පොස්පේට්

iv) ත්‍රිත්ව සුපර් පොස්පේට්, මියුරේට් ඔෆ් පොටෑෂ්, යූරියා

(16) කෘෂිකර්මයේදී ඇල්බට් ද්‍රාවණය භාවිතා කරනුයේ,

i) කෘමි පාලනයට | ii) පත්‍ර කැබලි මුල් ඇද්දවීමට
iii) පාංශු ආම්ලිකතාව උදාසීන කිරීමට | iv) ශාක පෝෂක මාධ්‍යක් ලෙස

(17) බීජ ප්‍රතිකාර කිරීමේ අරමුණක් **<u>නොවන්නේ</u>** මින් කුමක්ද?

i) බොල් බීජ ඉවත් කිරීම | ii) ප්‍රවේනික පාරිශුද්ධතාවය සෙවීම
iii) කෘමි හානි වැලැක්වීම | iv) වැපිරීම පහසු කිරීම

(18) ජම්බු ශාකයක ඉහළින් ඇති අත්තක් මුල් අද්දවා ගැනීමට යොදා ගත හැකි අතු බැඳීමේ ක්‍රමයකි,

i) සරල අතු බැඳීම | ii) සංයුක්ත අතු බැඳීම
iii) වායව අතු බැඳීම | iv) ගොඩැලි අතු බැඳීම

(19) ආහාර නරක්වීම කෙරෙහි බලපාන රසායනික හා මානව ක්‍රියාවක් වන්නේ,

i) එන්සයිම ක්‍රියාකාරිත්වය හා ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියා
ii) තෙතමනය හා ක්ෂුද්‍ර ජීවින්ගේ ක්‍රියා
iii) ආලෝකය හා මහා ජීවින්ගේ ක්‍රියා
iv) පීඩනය හා ආලෝකය

(20) ආහාර පරිරක්ෂණයේදී විසිරි වියලීම ක්‍රියාවලිය භාවිතා වන්නේ,

i) උකු කිරි නිෂ්පාදනයේදී | ii) පිටි කිරි නිෂ්පාදනයේදී
iii) තල් කිරි නිෂ්පාදනයේදී | iv) කිරි ජීවාණුහරණය කිරීමේදී

(21) ශ්‍රී ලංකාවේ දෙමුහුම් අභිජනනයෙන් නිපදවා ඇති වී ප්‍රභේද නම් කිරීමේදී වී ප්‍රභේදයේ වයසද සැලකිල්ලට ගෙන ඇති BW 351 වී ප්‍රභේදය වයස මාස,

i) 3 | ii) 3 1/2 | iii) 4 | iv) 4 1/2

(22) පාලිත තත්ව යටතේ බෝග වගාවේදී යොදාගන්නා ස්ථිර ආරක්ෂිත වගා ව්‍යුහයකි,

i) පාත්ති ආවරණ | ii) පේලි ආවරණ
iii) සරල සූර්ය ප්‍රචාරක | iv) දැල් ගෘහ

(23) කුඤ්ඤ බද්ධයක් සිදු කිරීමෙන් පසු අනුජය පොලිතින් කවරයකින් ආවරණය කරන්නේ,

i) කෘමි හානි පාලනය සඳහා | ii) රෝග පාලනය සඳහා
iii) උත්ස්වේදනය පාලනය සඳහා | iv) සුළඟින් වන හානි වැලැක්වීම සඳහා

(24) කෘමි පළිබෝධ පාලනයේදී වැදගත් වන ස්වාභාවික සතුරන් පමණක් අන්තර්ගත වරණය කුමක්ද?

i) බත්කුරා, දිමියා, පිටි මකුණා | ii) පැලමැක්කා, වන්දා, මකුළුවා
iii) දිමියා,මකුළුවා, වන්දා | iv) ලේඩිබර්ඩ්, සුදුමැස්සා, කුඩිත්තා

(25) වී බෝගය වගා බිමේ සංස්ථාපනය කිරීමේ ක්‍රමවේදයක් නොවන්නේ,

i) බීජ අහඹු ලෙස විසුරුවා හැරීම

ii) බීජ පැළ සිටුවීම හා විසුරුවා හැරීම

iii) බීජ වප්කරයෙන් පේළියට සිටුවීම

iv) අතින් බීජ පේළිවලට දැමීම

(26) වගා බිමේ වල් පැලෑටි මතුවීමට පෙර ඒවායේ බීජ විනාශ කිරීමට යොදන වල්නාශක කාණ්ඩය හඳුන්වන්නේ,

i) පූර්ව නිර්ගමන වල්නාශක ලෙසය

ii) පශ්චාත් නිර්ගමන වල්නාශක ලෙසය

iii) සියල්ල නසන වල්නාශක ලෙසය

iv) ස්පර්ශ වල්නාශක ලෙසය

(27) මිරිස්, බටු, තක්කාලි වැනි බෝග වලට වැළඳෙන බැක්ටීරියා වර්ගයකි,

i) දිය මලං කෑම

ii) පිටිපුස් රෝගය

iii) හිටුමැරීම

iv) ඇන්ත්‍රැක්නෝස් රෝගය

(28) අර්ධ රූපාන්තරණයක් ඇති සතෙකි,

i) ගොයම් මකුණා

ii) එපිලැක්නා

iii) පලතුරු මැස්සා

iv) ඉල්මැස්සා

(29) තවාන් පාත්තියකට කැප්ටාන් කුඩු මිශ්‍ර කිරීමේ අරමුණකි,

i) කෘමිහානි පාලනය

ii) දිලීර රෝග වර්ධනය

iii) වල් පැල පාලනය

iv) ක්ෂුද්‍රපෝෂක ලබාදීම

(30) ඇස් වල බිටෝල්ප ඇතිවන්නේ කුමන විටමිනයක් ඌන වීමෙන්ද?

i) විටමින් A

ii) විටමින් B

iii) විටමින් C

iv) විටමින් D

(31) ලෝහමය ඇසුරුම් ද්‍රව්‍ය සඳහා භාවිතා වන මූල ද්‍රව්‍යකි,

i) ටින්

ii) ටින් හා ඇලුමිනියම්

iii) ඇලුමිනියම්

iv) අයන්

(32) ශාකවලට පහසුවෙන් හා ඉතා ක්‍රමවත්ව (සූක්ෂම) ලෙස ජලය සපයන ක්‍රමයකි.

i) බිංදු ජල සම්පාදනය

ii) විසිරි ජල සම්පාදනය

iii) බේසම් ජල සම්පාදනය

iv) ඇළි ජල සම්පාදනය

(33) ආහාර පරිරක්ෂණ ක්‍රමයක් නොවන්නේ,

i) පැසවීම ii) සාන්ද්‍රීකරණය

iii) පැස්චරීකරණය iv) හුමාලයෙන් තැම්බීම

(34) පලතුරු ඉදීමේ ක්‍රියාවලියේදී කාබෝහයිඩ්‍රේට්

i) ග්ලූකෝස් බවට පත්වේ ii) ෆෲක්ටෝස් බවට පත්වේ

iii) මෝල්ටෝස් බවට පත්වේ iv) ලැක්ටෝස් බවට පත්වේ

(35) ශ්‍රී ලංකාව තුල පසු අස්වනු හානිය ප්‍රබලව දැකිය හැක්කේ,

i) අස්වනු නෙලීමේදී ii) අස්වනු ඇසිරීමේදී

iii) අස්වනු ප්‍රවාහනයේදී iv) අස්වනු අලෙවියේදී

(36) කඩින් කඩ බෝග වගාවේදී,

i) බෝග වර්ග කීපයක් එකවිට වගා කරයි

ii) අස්වනු නෙලීමට පෙර තවත් බෝගයක් ස්ථාපනය කරයි

iii) ප්‍රධාන බෝගයට අමතරව තවත් බෝගයක් වගා කරයි

iv) කන්නයෙන් කන්නයට මාරු කරමින් බෝග වගා කරයි

(37) කඩා හැළුණු පිහාටු, ශ්වසන අපහසුතා, විශාල ප්‍රමාණයක් එකවර මිය යාම මෙම රෝග ලක්ෂණ දැකිය හැකි වන්නේ කුමන කුකුල් රෝගයක් ආශ්‍රිතවද?

i) පණු රෝග ii) පුල්ලෝරම්

iii) කොක්සිඩියෝසිස් iv) රැනිකට්

(38) යුරෝපීය ගව වර්ගවල දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

i) සාපේක්ෂ විශාල ශරීරය හා මනාව වර්ධනය වූ මොල්ලිය

ii) වැඩි කිරි නිෂ්පාදන හා ස්වේද ග්‍රන්ථි ප්‍රමාණය අඩු වීම

iii) වැඩි කිරි නිෂ්පාදනය හා දිගු ලෝම පිහිටීම

iv) ඇඟට තද වූ සම හා පිටුපස රවුම් ශරීරය

(39) ශ්‍රී ලංකාවේ කිරි අවශ්‍යතාවය ලීටර් දස ලක්ෂ 784 පමණ වේ. නමුත් ශ්‍රී ලංකාව තුළ වාර්ෂික දළ නිෂ්පාදනය වන්නේ සාපේක්ෂව ඊට අඩු ප්‍රමාණයකි. දළ වශයෙන් එම ප්‍රමාණය ලීටර් දස ලක්ෂ,

i) 290 පමණ වේ ii) 500 පමණ වේ

iii) 382 පමණ වේ iv) 210 පමණ වේ

(40) කුකුළන් ඇති කිරීමේ සියුම් ක්‍රමයෙහි ඝන ආස්ථරන ක්‍රමයේදී,

i) මූලික වියදම අඩුය

ii) රෝග පැතිරීමේ ප්‍රවණතාවය අඩුය

iii) ආහාර සඳහා සතුන් අතර තරඟය අඩුය

iv) විලෝපිකයන්ගෙන් සිදුවන හානිය අඩුය

WWW.PastPapers.WIKI

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

තෙවන වාර පරීක්ෂණය 2020 | 11 ශ්‍රේණිය
மூன்றாம் தவணைப் பரீட்சை 2020 | தரம் 11
Third Term Test 2020 | **Grade 11**

කෘෂි හා ආහාර තාක්ෂණය II
விவசாய மற்றும் உணவுத்தொழினுட்பவியல் II
Agri & Food Technology II

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

• **පළමුවෙනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න**

දේශීය බෝග වගාවට අතහිත දීමක් ලෙස සෞඛ්‍ය ආරක්ෂිත ආහාර බෝග ප්‍රචලිත කිරීමක් ලෙසත් අපේ ආහාර ජනප්‍රිය කිරීම සඳහා කෘෂි ක්ෂේත්‍රය ප්‍රමුඛ වී ඇත.

(01) i) බෝග වගාව සඳහා සුදුසු පසක තිබිය යුතු භෞතික ගුණාංග දෙකක් නම් කරන්න.

ii) බෝග වගාවේදී භාවිතා කල හැකි කාබනික පොහොර වර්ග දෙකක් නම් කරන්න.

iii) බෝග වගාවකින් ප්‍රශස්ත අස්වැන්නක් ලබාගැනීමට බලපාන කාලගුණික පරාමිතීන් දෙකක් නම් කරන්න.

iv) ඔබ ගෙවත්තේ පැපොල් සහ බතල වගාවක් ආරම්භ කිරීමට අදහස් කරයි නම්, ඒ සඳහා සුදුසු පාත්ති වර්ගය බෝගය අනුව සඳහන් කරන්න.

v) මිරිස්, බටු, තක්කාලි වැනි බෝග සිටුවීමට තවාන් සකස් කිරීමේදී තවාන් මාධ්‍ය සඳහා යොදාගන්නා ද්‍රව්‍ය හා අනුපාතය සඳහන් කරන්න.

vi) ගෙවතු වගාවට යොදාගත හැකි පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රම දෙකක් නම් කරන්න.

vii) ඔබ ගෙවත්තේ ලෙමන් හා දෙහි ශාක ඇත්නම් එහි පැළ ප්‍රචාරණය සඳහා යොදාගත හැකි ලේයර් ක්‍රමයක් රූප සටහනක් ඇඳ පැහැදිලි කරන්න.

viii) උඩරට ගෙවතු වගාවේදී මිශ්‍ර බෝග වගා ක්‍රමයට බෝග වගාව සිදු කරනු ලැබේ. මෙහි ඇති වාසි දෙකක් සඳහන් කරන්න.

ix) පරිසර හිතකාමී පළිබෝධ පාලනය කිරීම සඳහා උපයෝගී වන පලිබෝධකයින්ගේ ස්වාභාවික සතුරන් දෙදෙනෙකු උදාහරණ සහිතව නම් කරන්න.

x) ප්‍රවාහණයේදී සිදුවන පසු අස්වනු හානිය අවම කර ගැනීමට ඔබ යොදාගන්නා උපක්‍රම දෙකක් සඳහන් කරන්න.

(02) බීජ වලින් හැර ශාකයේ අනෙකුත් කොටස්වලින් නව ශාක බිහිකර ගැනීම වර්ධක ප්‍රචාරණයයි. මේ සඳහා මව් ශාකයේ විවිධ වර්ධක කොටස් භාවිතා කරයි.

I. (a) මුල් කැබලි හා පත්‍ර කැබලි මගින් ප්‍රචාරණය කරගත හැකි බෝග වර්ග දෙක බැගින් වෙන වෙනම සඳහන් කරන්න. (ල - 02)

(b) දඬු කැබලි මුල් ඇදීම උත්තේජනය කිරීමට යොදාගන්නා ක්‍රම දෙකක් නම් කරන්න. (ල - 02)

II. (a) බද්ධ කිරීම සඳහා යොදාගන්නා ග්‍රාහකයක තිබිය යුතු ගුණාංග දෙකක් සඳහන් කරන්න. (ල - 01)

(b) අඹ පැලයකට ආරුක්කු බද්ධයක් සිදුකරන ආකාරය නම් කරන ලද රූප සටහනකින් පැහැදිලි කරන්න. (ල - 03)

III. වර්ධක ප්‍රචාරණයේ වාසි 4 ක් සඳහන් කරන්න. (ල - 02)

(03) බෝග වගාවේදී පෝෂක ඌණතා මගහරවා ගැනීම සඳහා පොහොර යොදනු ලැබේ.

I. (a) බෝගවල පැවැත්ම සඳහා අවශ්‍ය ක්ෂුද්‍ර මූල ද්‍රව්‍ය හතරක් සඳහන් කරන්න. (ල - 02)

(b) පොටෑසියම් හිඟවීම නිසා ශාකවල දක්නට ලැබෙන ඌණතා ලක්ෂණ දෙකක් නම් කරන්න. (ල - 02)

II. (a) බෝගවලට පොහොර යෙදිය හැකි ක්‍රම හතරක් සඳහන් කරන්න. (ල - 02)

(b) බෝගවලට රසායනික පොහොර යෙදීමෙන් සිදුවිය හැකි අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න (ල - 01)

III. (a) කොළ පොහොර ලෙස යොදාගත හැකි ශාක වර්ග දෙකක් නම් කරන්න (ල - 01)

(b) තම ගොවිපළේදීම නිපදවාගත හැකි කාබනික දියර පොහොර වලට උදාහරණ දෙකක් සඳහන් කරන්න. (ල-02)

(04) ක්‍රමවත් ලෙස බිම් සැකසීම හා ජල පාලනය බෝග වගාවේදී උසස් අස්වැන්නක් ලබා ගැනීමට ඉවහල් වන ක්‍රමෝපායකි.

I. (a) බිම් සැකසීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න. (ල - 02)

(b) මූලික බිම් සැකසීමේ ප්‍රධාන පියවර දෙක නම් කරන්න. (ල - 02)

II. (a) කෝනෝ වීඩරය හෝ උපකරණය සහ තුන් පුරුක් කල්ටිවේටරය කුමන කාර්යයන් සඳහා භාවිතා කරන්නේද? (ල-01)

(b) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගොවියෙකුට බඩ ඉරිඟු, සෝයා බෝංචි, මුං ඇට වැනි බීජ වැපිරීමට වඩාත් සුදුසු උපකරණයක් නම් කරන්න. (ල - 01)

III. (a) වී වගාව සඳහා සුදුසු ජල සම්පාදන ක්‍රමය සඳහන් කර එහි වාසි දෙකක් දක්වන්න. (ල - 03)

(b) පසක ජල වහනය දියුණු කිරීමට යොදාගත හැකි කාණු රටා දෙකක් සඳහන් කරන්න.(ල - 01)

(05) සාර්ථක බෝග අස්වැන්නක් ලබා ගැනීම සඳහා පලිබෝධ හානි අවම කිරීම ඉතා වැදගත් වේ. බිම් සැකසීමේ සිට අස්වනු නෙලීම දක්වා සියලුම ක්‍රියාකාරකම් පලිබෝධ හානි අවම කිරීම සඳහා අවධානය යොමු කල යුතුය.

I. (a) වැඩෙන ස්ථානය අනුව වල්පැළෑටි වර්ගීකරණය දක්වා ඒ සඳහා උදාහරණ එක බැගින් ලියන්න. (ල - 02)

(b) බෝග වගාවේදී වල්පැළෑටි පාලනය කිරීම සඳහා යොදාගත හැකි රසායනික නොවන ක්‍රම හතරක් ලියන්න. (ල - 02)

II. (a) කෘමි පළිබෝධකයින් බෝග වලට හානි කරන ආකාර දෙකක් සඳහන් කොට ඒ සඳහා උදාහරණ එක බැගින් ලියන්න. (ල - 02)

(b) පරිසර හිතකාමී කෘමි පළිබෝධ පාලන ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ල - 01)

III. පලතුරු සහ එළවළු බෝග වලට වැළඳෙන ඇන්ත්‍රැක්නෝස් රෝගයේ ලක්ෂණ දෙකක් හා එම රෝගය පාලනය සඳහා යොදා ගත හැකි ක්‍රම දෙකක් ලියන්න. (ල - 03)

(06) සංවර්ධිත රටවල පසු අස්වනු හානිය 10% පමණ වේ. ශ්‍රී ලංකාවේ ඇතුළු සංවර්ධනය වන රටවල එය 20% - 40% අතර අගයක් ගනී. නිෂ්පාදන වල මිල කෙරෙහි මේ තත්වය සෘජුවම බලපානු ඇත.

I. (a) පසු අස්වනු හානිය කෙරෙහි පෙර අස්වනු සාධක බලපානු ලබයි. එවැනි පෙර අස්වනු සාධක 2 ක් නම් කරන්න. (ල - 01)

(b) පසු අස්වනු හානිය වැලැක්වීම, ගොවියාට වැදගත් වන ආකාර දෙකක් සඳහන් කරන්න. (ල - 02)

II. (a) අස්වනු ගබඩා කිරීමේදී නිසි අයුරින් සිදු නොකිරීම නිසා සිදුවන හානි අවස්ථා 02 ක් ලියන්න. (ල - 02)

(b) අලෙවියේදී අස්වැන්නට ගුණාත්මක වශයෙන් සිදුවන හානි අවස්ථා 02 ක් සඳහන් කරන්න. (ල - 02)

III. පසු අස්වනු හානියේ අලාභය පාරිභෝගිකයා වෙත පැවරෙන්නේ කෙසේදැයි සැකෙවින් පැහැදිලි කරන්න. (ල - 03)

(07) ගොවිපළ හිමිකරුවන් ගොවිපලේ සතුන් පිළිබඳ නිතර පරීක්ෂාවෙන් සිටීම තුළින් තම ගොවිපලේ කටයුතු මනාව පවත්වාගෙන යා හැකිය.

I. ගොවිපලේ සතුන්ගේ පහත සඳහන් ලක්ෂණ දක්නට ලැබුණි නම් ඊට හේතු එක බැගින් සඳහන් කරන්න.

a. කිරි ගවයෙකු බෙල්ල පසුපසට හරවා සිහි මඳගතියෙන් බිම වැතිර සිටීම.

b. කිකිළි බිත්තර වල කටුව තුනී ස්වභාවයක් ගැනීම.

c. ලේ සහිත දුඹුරු පැහැති කුකුළු වසුරු (මළද්‍රව්‍ය) තිබීම.

d. බෲඩරය තුළ කුකුළු පැටවුන් එක් තැනක එකට ගුලි වී සිටීම. (ල - 02)

II (a) ගව නිවාසයක තිබිය යුතු අංග තුනක් සඳහන් කරන්න. (ල - 03)

(b) ගව නිවසක එක් කිරි ගවයෙකු සඳහා අවශ්‍ය ඉඩ ප්‍රමාණය කොපමණද? (ල - 01)

III. (a) ඝන ආස්තරණ ක්‍රමයේදී අතුරුණුව සඳහා යොදාගත හැකි ද්‍රව්‍ය දෙකක් සඳහන් කරන්න. (ල - 01)

(b) හොඳ අතුරුණුවක තිබිය යුතු ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ල - 03)

WWW.PastPapers.WIKI

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

තෙවන වාර පරීක්ෂණය 2020 | 11 ශ්‍රේණිය
மூன்றாம் தவணைப் பரீட்சை 2020 | தரம் 11
Third Term Test 2020 | **Grade 11**

කෘෂි හා ආහාර තාක්ෂණය
விவசாய மற்றும் உணவுத்தொழினுட்பவியல்
Agri & Food Technology

පිළිතුරු
விடைகள்
Answer

I පත්‍රය

1 - 1	11 - 1	21 - 2	31 - 2
2 - 2	12 - 3	22 - 4	32 - 1
3 - 4	13 - 3	23 - 3	33 - 4
4 - 2	14 - 4	24 - 3	34 - 2
5 - 2	15 - 1	25 - 4	35 - 3
6 - 3	16 - 4	26 - 1	36 - 2
7 - 1	17 - 2	27 - 3	37 - 4
8 - 3	18 - 3	28 - 1	38 - 2
9 - 4	19 - 1	29 - 2	39 - 3
10 - 2	20 - 2	30 - 1	40 - 4

II පත්‍රය

01.

I
- කැටිති ව්‍යුහයක් සහිත ලෝම පසක්
- කළු වර්ණයෙන් යුත් කාබනික ද්‍රව්‍ය අඩංගු පසක්
- ජල අවශෝෂණය හා මනා ජල වහනය සහිත

II
- සත්ත්ව පොහොර
- කොම්පෝස්ට් පොහොර
- කොල පෙහොර

III
- වර්ෂාපතනය • ආලෝකය • උෂ්ණත්වය • සුළඟ

IV පැපොල් - තනි වගා වලවල්

බතල - වැටි හා කාණු

V මතුපිට පස් කොම්පෝස්ට් 1:1 අනුපාතයට

VI තීරු ජලසම්පාදනය

ඇලි හා වැටි ක්‍රමය

VII ලෙමන් දෙහි



VIII

- ඒකීය ක්ෂේත්‍රයකින් වැඩි අස්වැන්නක් ලබාගත හැකි
- වසර පුරා අස්වැන්න ලබාගත හැකි
- විශේෂ බිම් සැකසීමේ ක්‍රම අවශ්‍ය නොවීම.
- පාංශුඛාදනය අවම වීම.

IX

- වී වගාවේ කෘමීන් ආහාරයට ගනී. - බත්කූරා
- පොල් වගාවේ කොරපොතු කෘමීන් පාලනයට - ලේඩී බර්ඩ්
- බෝග වගාවේ පණුවන් ආහාරයට - මකුළුවන් , කුරුල්ලන්

X * කූඩා භාවිතය , * වර්ගකර ප්‍රවාහනය

02.

I. (a) මුල් - කරපිංචා , දෙල් , බෙලි , තේක්ක

පත්‍ර - බිගෝනියා, සැන්සවේරියා, පෙපරෝමියා

(b) සුදුසු පරිසර තත්ව සැපයීම

මුල් ඇදීම උත්තේජනය කරන හෝමෝන භාවිතය

II. (a)
- ශක්තිමත් මූල පද්ධතියක්
- අහිතකර පරිසර තත්ත්ව වලට ඔරොත්තු දිම
- නීරෝගී වීම
- පහසුවෙන් සපයාගත හැකි වීම

(b)



III.
- මව් ශාකයට සමාන පැල ලබා ගතහැකි.
- ඒකාකාරී වගාවක් පවත්වා ගත හැකි
- බීජ ප්‍රචාරණය අපහසු ශාක සඳහා යොදාගත හැකි.

03.

I. (a) සින්ක් ,කොපර් ,මැංගනීස්, මොලිබ්ඩිනම්, බෝරෝන්, යකඩ, කෝලෝරීන්

(b)
- පත්‍ර දාර කහපාට වීම.
- පත්‍ර දාර පසුව පිලිස්සුන ස්වාභාවයක් ගැනීම

II. (a) ඉසීම, පැල අවට යෙදීම, ජලයට මිශ්‍ර කිරීම, පේලි වලට යෙදීම

(b) • පසේ PH අගය වෙනස් වීම.

• ප්‍රමාණය වැඩි වූ විට ශාකවලට හානී සිදුවීම.

• සමහර පොහොර වර්ග ගබඩාවේදී දිය වීම.

III. (a) ග්ලීරිසීඩියා, ඉපිල් ඉපිල්, වල්සූරියකාන්ත

(b) • කුකුල් පොහොර හා කොල පොහොර නිස්සාරණය

• ගැඩවිල් පණු දියර

• මත්ස්‍ය තෛලෝදය

04.

I. (a) • පසෙහි භෞතික තත්වය දියුණු කිරීම

- පසෙහි ඇති ගල් මුල් ආදිය ඉවත් කිරීම.
- පසට පොහොර මිශ්‍ර කිරීම
- පළිබෝධ පාලනය

(b) • ප්‍රාථමික බිම් සැකසීම

• ද්විතීක බිම් සැකසීම

II. (a) අතුරුයන් ගෑම සඳහා

(b) ගොඩබීජ වප්කරය F.M.R.C.

III. (a) පිටාර ක්‍රමය

▪ වාසි - මූලික වියදම අඩුයි.
- විශේෂ තාක්ෂණික දැනුමක් අවශ්‍ය නොවේ.
- වල්පැල පාලනයට සුදුසු ක්‍රමයකි.
- පසේ ලවණතාව ඉවත්කල හැකි.

(b) • හෙරින්බෝන් ක්‍රමය

• සමාන්තර ක්‍රමය

05.

I. (a) ගොඩබිම වැඩෙන වල් පැළෑටි

* මොණරකුඩුම්බිය, කුප්පමේනියා, නිදිකුම්බා,

ජලයේ වැඩෙන වල් පැළෑටි

උදා - දිය සියඹලා, දිය හබරල, ගිරාපලා

(b) • ගැඹුරට පස පෙරළීම

- පස ආවරණය කරන බෝග සිටුවීම
- උදළු ගෑම, වායව කොටස් කපා දැමීම
- නිසි පරතරයට බෝග සිටවීම
- වල් පැළෑටි අතින් උදුරා දැම්ම
- පස වසුන් කිරීම
- ජලය බැඳ තැබීම
- ජීවීන් යොදා ගැනීම
- පිරිසිදු කෘෂි උපකරණ භාවිතය
- ඇල මාර්ග පිරිසිදුව තබාගැනීම

II. (a) • පත්‍රවල යුෂ උරාබීම - දුඹුරු පැල කීඩෑවන්

- ඵල සිදුරු කිරීම - ඉල්මැස්සා, පළතුරු මැස්සා කොටස් ආහාරයට ගැනිම
- පත්‍ර කා දැමීම - අවුලකපෝරා
- පත්‍ර සූරා කෑම - එපිලැග්නා
- කදේ පටක කොටස් කා දැමීම - රතු පොල් ගුල්ලා
- පත්‍ර හැකිලීම - කොපු පණුවා
- කඳ සිදුරු කිරීම - කෙසෙල් කඳ ගුල්ලා

(b) • ප්‍රතිරෝධී ප්‍රභේද වගා කිරීම ● විකර්ෂණ බෝග සිටුවීම

- පෙරමෝන උගුල් භාවිතය ● හානිඵල විනාශ කිරීම
- අල්ලා විනාශ කිරීම ● සබන් දියර
- පස් පෙරළීම ● කොහොඹ ඇට සාරය

III. • පත්‍ර මත අක්‍රමවත් පුල්ලි

- ඒවා කහ දුඹුරු හෝ කළු පැහැ ගනී
- ඵල මත තෙත රවුම් පුල්ලි
- රෝස පැහැති දිලීර බීජාණු
- ඵල කුණුවීම
- පුල්ලි සහිත පත්‍ර හැලීයාම

06.

I. (a) ● ප්‍රදේශයට ගැලපෙන බෝග තෝරා ගැනීම

- ගුණාත්මක රෝපණ ද්‍රව්‍යය භාවිතය
- ක්‍රමවත් ජල සම්පාදනය
- පොහොර යෙදීම
- පළිබෝධ, පළිබෝධ පාලනය
- කෘෂි රසායන භාවිතය
- වර්ෂාපතනය , උෂ්ණත්වය, ආලෝකය, සුළඟ, ආර්ද්‍රතාවය
- බෝග නඩත්තුව

(b) ● ගොවියාට ඉහල මිලක් ලැබීම

- අවදානම අවම වීම
- ස්ථාවර වෙළඳපොලක් ඇතිවිම
- ඉල්ලුම ඉහල යාම
- පාරිභෝගික විශ්වාසය

II. (a) ● කෘමිහානි ඇතිවිම

- වෙනත් සතුන්ගෙන් හානිවීම
- යාන්ත්‍රික හානි (එකමත එක පැටවීම)
- උෂ්ණත්ව හානි
- ආර්ද්‍රතාවයේ බලපෑම (බීජ පැළවීම)

(b) ● අව්වට නිරාවරණය වීම, වියළීම

- ගොඩගසා තිබිම, පහළ ස්ථර තැලීම
- දූවිලි, දුම් වැදීම, පැහැය වෙනස් වීම
- අපද්‍රව්‍යය එකතු වීම, ගුණාත්මක බවට හානි

WWW.PastPapers.WIKI

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!